කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල
**Zonal Education Office - Piliyandala**

දෙවන වාර ඇගයීම - 2017
**Second Term Evaluation -2017**

| ගණිතය I/II<br>**Mathematics I/II** | 8 ශ්‍රේණිය<br>**Grade 8** | පැය දෙකයි<br>***Two Hours*** |
|---|---|---|

නම :- ....................................................... විභාග අංකය :- ..................................

## I කොටස

- ❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- ❖ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමිවේ.

1. 6, 13, 20, ... යන සංඛ්‍යා අනුක්‍රමයේ ඊළඟ පද දෙක ලියන්න.

2. පොදු පදය $4n$ වූ සංඛ්‍යා රටාවේ 8 වන පදය කීයද?

3. සුළු කරන්න. $2\frac{2}{3} \times \frac{1}{8}$

4. ත්‍රිකෝණයේ පාදවල දී ඇති දිග ඇසුරින් පරිමිතිය $P$ සඳහා ප්‍රකාශනයක් ලියන්න.




5. $(-5) - (-3) = \square$ හිස් කොටුවට සුදුසු අගය ලියන්න.

6. $A\hat{O}C$ හි අගය සොයන්න.




7. ඝන වස්තුවක මුහුණත් 5 ක්ද, ශීර්ෂ 6 ක්ද ඇත . එහි ඇති දාර ගණන සොයන්න.

8. සුදුසු පරිදි $>, <, =$ සංකේතවලින් එකක් යොදා හිස්තැන් පුරවන්න.
   (i) $0.9t$ $\square$ $0.950kg$
   (ii) $3.03km$ $\square$ $3030m$

9. පොතක මිල පෑනක මිල මෙන් තුන් ගුණයකි. පෑනක මිල රු $x$ නම්, පොත් දෙකක හා පෑන් දෙකක මිල සඳහා ප්‍රකාශනයක් ලියන්න.

10. $A = \{COLOMBO$ යන වචනයේ අකුරුකුලකය$\}$ වෙනත් කුලක අංකන ක්‍රමයකින් දක්වන්න.

11. මෙම රූපයේ භ්‍රමක සමමිති ගණය කීයද?



12. $x^2 - x$ ප්‍රකාශනයේ සාධක වෙන්කර ලියන්න.

13. එක්තරා කෑම වර්ගයක් සෑදීමට පාන් පිටි $1.5kg$ ද, සීනි $750g$ ද, මාගරින් $250g$ ද අවශ්‍ය විය. මෙම ද්‍රව්‍ය තුන අතර අනුපාතය සොයන්න.

14. $4x - 8 = 4$ විසඳන්න.

15. $\in, \notin$ මෙම සංකේත ඇසුරින් පහත හිස්තැන් පුරවන්න.

4 ......... $A$

5 ......... $A$




16. 45° හි අනුපූරකය ලියන්න.

17. වරහන් ඉවත්කර සුළු කරන්න. $2(3x + 2) - 2(x - 3)$

18. $4:3 = 12:x$ නම්, $x$ හි අගය සොයන්න.

19. ආධාරකය $7cm$ හා ලම්බ උස $6cm$ වන සෘජුකෝණී ත්‍රිකෝණයක වර්ගඵලය සොයන්න.

20. ප්‍රථමක සාධක ඇසුරින් 729 හි වර්ගමූලය සොයන්න.

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- ❖ පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද, ඉතිරි ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමිවේ.
- ❖ පිළිතුරු ලිවීම සඳහා වෙනත් කඩදාසි භාවිතා කරන්න.

1. ඔබ පන්ති කාමරයේදී දර්ශක පාඩම සඳහා සිදුකළ ක්‍රියාකාරකම ඇසුරින් ලබාගත් දැනුම භාවිත කරමින් හිස්තැන් පුරවන්න.

(i) $2^2 = \square$

(ii) $3^2 = \square$

(iii) $2^2 \times 3^2 = \square \times 9 = \square$ ← A

(iv) $(2\times3)^2 = 6^{\square} = \square$

ඉහත (iii) හා (iv) ප්‍රශ්න සඳහා ලැබෙන පිළිතුරු අනුව $2^2\times3^2$ හා $(2\times3)^2$ අතර සම්බන්ධය පහත කොටුව තුළ ලියන්න.

$\square$ ← B

ඉහත B හි ලබාගත් සම්බන්ධය ඇසුරින් පහත සඳහන් හිස්තැන් පුරවන්න.

1. $5^3 \times 3^3 = (____)^{---}$
2. $___ \times ___ = (3 \times 4)^2$
3. $a^2 \times b^2 = (___ \times ___)^2$
4. $(2\times a)^3 = (___\ ___) = ___$

2. (a) සුළු කරන්න.

(i) $1\frac{2}{3} + \frac{5}{6}$

(ii) $2\frac{2}{3} \times \frac{5}{14}$

(iii) $3\frac{1}{2} \div \frac{3}{4}$

(b) සමචතුරස්‍රයක වර්ගඵලය $576cm^2$ වේ.

(i) 576 ප්‍රථමක සාධකවල ගුණිතයක් සේ ලියන්න.

(ii) ඒ ඇසුරින් $\sqrt{576}$ හි අගය සොයන්න.

3. (a) දී ඇති රූපය ඇසුරින් අගයන් සොයන්න.




$x = \ldots\ldots\ldots$

$y = \ldots\ldots\ldots$

$Z = \ldots\ldots\ldots$

(b)




(i) $d$ ට අනුරූප කෝණය ......... වේ.

(ii) $c$ ට ඒකාන්තර කෝණය ......... වේ.

(iii) $a + b + c + d$ හි එකතුව ........... වේ.

4. (a) $A$ යනු 1 සිට 25 තෙක් ඇති වර්ග සංඛ්‍යා සහිත කුලකයකි.

(i) $A$ අවයව සහිතව ලියා දක්වන්න.

(ii) $n(A)$ ලියන්න.

(b) සංඛ්‍යා රටාවක පොදු පදය $2n + 3$ වේ.

(i) මෙම සංඛ්‍යා රටාවේ පළමු පද 3 ලියන්න.

(ii) 61 වන්නේ කීවෙනි පදයද?

5. (a) ශරේන් ළඟ රු $x$ ඇත. රයන් ළඟ ශරේන් ළඟ ඇති මුදලට වඩා රු 100 ක් ඇත.

(i) රයන් ළඟ ඇති මුදල සොයන්න.

(ii) ශරේන් සහ රයන් ළඟ ඇති මුදල රු 500 ක් නම් ඔවුන් ළඟ ඇති මුළු මුදල සඳහා වීජීය සමීකරණයක් ගොඩනගන්න.

(iii) එය විසඳා දෙදෙනා ළඟ ඇති මුදල් වෙන වෙනම දක්වන්න.

(b) පහත වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශනය | සාධක දෙකක ගුණිතයක් සේ |
|---|---|
| $15pq + 20pr$ | ...................................... |
| ......................... | $2a(a + 3b + 2ac)$ |

6. (a) ප්‍රතිශත බවට හරවන්න.

(i) $\frac{7}{25}$ (ii) 0.4

(b) පාසලක ළමුන් 2500 ක ගෙන් 1300 ක් පිරිමි ළමුන් වේ.

(i) පාසලේ ගැහැණු ළමයි මුළු පිරිසෙහි භාගයක් ලෙස ලියන්න.

(ii) පාසලේ ගැහැණු ළමයි ප්‍රතිශතය සොයන්න.

(c) පාසල් බෑගයක නිෂ්පාදිත වියදම රු. 900 කි. නිෂ්පාදන වියදමෙන් 20% ක් ලාභ ලබා ගැනීමට නිෂ්පාදකයා බලාපොරොත්තු වේනම්,

(i) ඔහු අපේක්ෂිත ලාභය සොයන්න.

(ii) ඒ අනුව බෑගය විකිණිය යුතු මුදල සොයන්න.

7. (a) (i) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් $(+5) - (-1)$ හි අගය සොයන්න.

(ii) $\frac{(-12) \times (-4)}{(+6) \times (-2)}$ අගය සොයන්න.

(b)




දී ඇති රූපය ඇසුරින්,

(i) එහි පරිමිතිය සොයන්න.

(ii) වර්ගඵලය සොයන්න.